# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය.

**අභියාචනා අංක:- AAT/203/2020 (NPC)**

ඒ.එම්.එච්.බී.අත්තනායක
**අභියාචක**

**එදිරිව,**

ජාතික පොලිස් කොමිෂන් සභාව
**වගඋත්තරකරු**

**දිනය : 2026.01.27**

| | | |
|---|---|---|
| **ඉදිරියේ දී** | **විනිසුරු කේ.ටී.චිත්‍රසිරි** | **(සභාපති)** |
| | **ජේ.ජේ.රත්නසිරි** | **(සාමාජික)** |
| | **එස්.නන්දසේකරන්** | **(සාමාජික)** |

පෙනී සිටීම :- අභියාචක සිටී.
අභියාචක වෙනුවෙන් විශ්‍රාමික රජයේ සේවක තිස්ස ගුණතිලක මහතා.
වගඋත්තරකාර ජාතික පොලිස් කොමිෂන් සභාව වෙනුවෙන් නියෝජ්‍ය අධ්‍යක්ෂ ආර්.එම්.එස්.පී.රත්නායක මහතා.

**-<u>නියෝගය</u>-**

දෙපාර්ශවය විසින් ඉදිරිපත් කළ කරුණු වලට සවන් දුනිමු. ඉන් අනතුරුව අභියාචක වෙනුවෙන් පෙනී සිටින ගුණතිලක මහතා තවදුරටත් මෙසේ කරුණු දක්වා සිටී.

"අභියාචක සේවයේ නොසිටි කාලයට වැටුප් ලබා ගැනීමට හිමිකම නැතත්, අදාළ වැටුප් වර්ධක මත වැටුප් පරිමාණය අදාළ පියවරෙහි තබා වැටුප් ලබා ගැනීමට ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ 24:4 වගන්තියට අනුව අයිතිවාසිකමක් ඇති බව පෙනී යන හෙයින්, ඒ සඳහා

ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට යටත්ව මෙම අභියාචනය ඉල්ලා අස් කර ගැනීමට අවසර පතමි.''

ඉහත කරුණු සළකා බලා ඉහතින් සඳහන් කර ඇති පරිදි අභියාචක විසින් නිසි ස්ථානයකට හෝ බලධාරියකුට කරුණු ඉදිරිපත් කිරීමේ අයිතිවාසිකම ඔහු වෙත රඳවා තබමින්, මෙම අභියාචනය ඉල්ලා අස් කර ගැනීමට කර ඇති ඉල්ලීමට අවසර දෙමු.

ඒ අනුව මෙම අභියාචනය නිෂ්ප්‍රභා කරමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි.

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි.

එස්.නන්දසේකරන්
(සාමාජික)

දෙව්මිනි/